# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/34 – 2022 නොවැම්බර් 16 වැනි බදාදා – 2022.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 166 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/12/2021/CEB/192.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* KDS/GIK/4/4/41.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, ගඟ ඉහළ කෝරළේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ ඉහළ කෝරළේ සුළු කොට්ඨාසයේ, ගම්පොලවෙල (1077), ඇත්ගාල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක Maha/GIK/2021/715 හා 2022.02.23 වන දිනැති ප්‍රගමන අණුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් වලට මායිම්:

01. **කැබලි අක්ෂර A - මගේවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0904.** උතුරට: නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත; නැගෙනහිරට: නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත, මහවැලි ගඟ සහ මුපි මහ 6621 හි කැබලි අංක 1; දකුණට: මුපි මහ 6621හි කැබලි අංක 1, ඇළ සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B, ඇළ (පාළුවූ) සහ නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත.

02. **කැබලි අක්ෂර B - ඉඩමේ නම සඳහන් නොවේ - ප්‍රමාණයඃ හෙක්. 0.0094.**

උතුරට: ඇළ සහ නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර A, මු.පි. මහ 6621හි කැබලි අංක 1 සහ ඇළ; දකුණට: ඇළ; බටහිරට: කැබලි අක්ෂර C, නාරංගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත සහ ඇළ.

03. **කැබලි අක්ෂර C - මගේවත්ත - ප්‍රමාණයඃ හෙක්. 0.0597.**

උතුරට: නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත,ඇළ (පාළුවූ), කැබලි අක්ෂර B සහ ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර B ඇළ සහ මළ ඇළ; දකුණට: මළ ඇළ සහ දුන්හිඳ ඇළ; බටහිරට: දුන්හිඳ ඇළ සහ නාරන්ගල සමරසිංහ හිමිකම් කියන මගේවත්ත.

EOG 11 - 0176

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.